ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

| | | |
|---|---|---|
| බුද්ධ ධර්මය I<br>பௌத்தம் I<br>Buddhism I | 41 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ, පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**
* එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** යි.

1. බුදුරජාණන් වහන්සේට සමකාලීන වූ මහණ බමුණන් කිසිවෙකුත් නොලද, බුදුරදුන්ටම සුවිශේෂ වූ ඥාණාධිගමයක් වන්නේ,
   (1) චේතොපරිය ඥානයයි. (2) සුතමය ඥානයයි.
   (3) ආසවක්ඛය ඥානයයි. (4) නෙවසඤ්ඤානාසඤ්ඤායතනයයි.
   (5) දිබ්බචක්ඛු ඥානයයි.

2. 'බෞද්ධයන් වශයෙන් අපට ඇති ලොකුම ආඩම්බරය නම් අපගේ ශාස්තෘවරයා ඉතිහාසයක් නැති දෙවියෙකු නොව ඉතිහාසයක් ඇති මනුෂ්‍යයෙකු වීමයි.' එසේ බුදුරදුන්ගේ ඓතිහාසිකත්වය පිළිබඳ තොරතුරු දක්නට ලැබෙන මූලාශ්‍රයක් වන්නේ,
   (1) සමන්තපාසාදිකාවයි. (2) පාරාජිකපාළියයි.
   (3) බුද්ධවංශයයි. (4) චුල්ලවග්ගපාළියයි.
   (5) පුද්ගලපඤ්ඤත්තිප්පකරණයයි.

3. මහාසීහනාද සූත්‍රයෙහි සඳහන් පරිදි බුදුරජාණන් වහන්සේගේ සුවිශේෂ ඥානබල දහයෙන් එකක් වන්නේ,
   (1) අනාවරණ ඥානයයි. (2) ඉද්ධිවිධ ඥානයයි.
   (3) සබ්බඤ්ඤුත ඥානයයි. (4) යමකපාටිහාරිය ඥානයයි.
   (5) නානාධිමුත්තිකතා ඥානයයි.

4. සූත්‍රාගත තොරතුරු අනුව බුදුරජාණන් වහන්සේ අන්‍යාගමික ආශ්‍රමයකට වැඩම කර ධර්ම සාකච්ඡාවක් පැවැත් වූ අවස්ථාවක් නම්,
   (1) මහාවීර නිගණ්ඨනාතපුත්ත හමුවීමට වැඩම කිරීමයි.
   (2) උරුවෙල් කාශ්‍යපතුමාගේ අසපුවට වැඩම කිරීමයි.
   (3) සංජය බෙල්ලට්ඨිපුත්ත හමුවට වැඩම කිරීමයි.
   (4) සකුළුදායි පිරිවැජියා හමු වූ අවස්ථාවයි.
   (5) උපක ආජීවකයා හමුවීමයි.

5. අටලෝ දහමට අකම්පිතව මුහුණදීමෙන් ප්‍රකටවන උදාර බුදුගුණය වන්නේ,
   (1) පුරිසදම්මසාරථී ගුණයයි. (2) තාදී ගුණයයි.
   (3) පද්මාකාර ජීවිතයයි. (4) සමානාත්මතා ගුණයයි.
   (5) යථාවාදී තථාකාරී ගුණයයි.

6. පහත සඳහන් ග්‍රන්ථ අතුරෙන් අභිධර්ම පිටකයට අයත් **නොවන්නේ**,
   (1) විභංගප්පකරණයයි. (2) පුද්ගලපඤ්ඤත්තිප්පකරණයයි.
   (3) පට්ඨානප්පකරණයයි. (4) නෙත්තිප්පකරණයයි.
   (5) ධම්මසංගණිප්පකරණයයි.

[දෙවැනි පිටුව බලන්න.

7. ධර්ම රත්නයෙහි ගුණ සයක් දැක්වෙන පාඨයෙහි 'අකාලික' යන්නෙන් පෙන්වා දෙන්නේ,
(1) ධර්මය උපමානුසාරීව දැක්විය හැකි බව ය.
(2) බුදුදහම හුදෙක් න්‍යායාත්මක බවටම වහල් නොවන බව ය.
(3) කල් නොයවා ප්‍රතිඵල අත්දැකිය හැකි බව ය.
(4) සාන්දෘෂ්ටික වශයෙන් ම ප්‍රතිඵල උදාකරන බව ය.
(5) තම තම නැණ පමණින් දත යුතු බව ය.

8. 'බුදුදහම සදාකාලික හෝ තාවකාලික හෝ ආත්මයක් ඇත' යන්න නොපිළිගන්නා දහමකි. ඒ අනුව සමකාලීන ආත්ම සංකල්පය විචාරයට ලක්කරමින් බුදුරදුන් දේශනා කර ඇත්තේ,
(1) ආත්මයක් ඇත්නම් එය අපට අවනත විය යුතු බව ය.
(2) භවගාමී ආත්මය නිවන් දක්නා තෙක් පමණක් පවත්නා බව ය.
(3) රූප වේදනාදී ස්කන්ධ ධර්මයන්ට පරිබාහිර වූ ආත්මයක් ඇති බව ය.
(4) කුසලාකුසල කර්ම කරන හා විපාක විඳින ආත්මයක් පමණක් පවත්නා බව ය.
(5) සියල්ල මරණින් නිමවන බැවින් සදාකාලික ආත්මයක් නැති බව ය.

9. විමසන සුළු භික්ෂුව විසින් තථාගතයන් වහන්සේ පිළිබඳ කරුණු දෙකක් විමසීමට ලක් කළ යුතු යැයි වීමංසක සූත්‍රය උගන්වයි. එම කරුණු දෙක වන්නේ,
(1) කරුණාව හා ප්‍රඥාවයි.
(2) කාය සමාචාරය හා වාග් සමාචාරයයි.
(3) අතීත පැවැත්ම හා අනාගත පැවැත්මයි.
(4) සිදුකර ඇති කුසලකර්ම හා අකුසලකර්මයි.
(5) වදාළ ධර්මය හා නොවදාළ ධර්මයයි.

10. ජාති, ජරා, ව්‍යාධි, මරණාදී දුක්ඛ දොම්නස්සයන්ගෙන් මිදී විමුක්තිය ලබනු පිණිස බුදුරදුන් උගන්වා ඇති ඒකායන මාර්ගයේ සුවිශේෂ ලක්ෂණයක් වන්නේ,
(1) නිතර පින්දහම් කිරීමට ඉගැන්වීමයි.
(2) සියලු දේව විශ්වාස පිටු දැකීමයි.
(3) අනුපූර්ව ප්‍රතිපදාවක් වෙත යොමු කිරීමයි.
(4) අබෞද්ධ විමුක්ති මාර්ගවලට එරෙහි වීමයි.
(5) වන්දනාමාන ප්‍රතික්ෂේප කිරීමයි.

11. බුද්ධකාලීන අබෞද්ධ ශ්‍රමණ කොටස්වලට මෙන්ම බෞද්ධ භික්ෂු සමාජයට ද පොදු වූ ලක්ෂණයක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) ආත්මවාදී නොවීමයි.
(2) අත්තකිලමථානුයෝගයට නොවැටීමයි.
(3) වර්ණාශ්‍රමධර්ම පිළිගැනීමයි.
(4) අනාගාරික ජීවිත ගත කිරීමයි.
(5) කර්ම ඵල විශ්වාසයයි.

12. "කාය පරිහරණයට අවශ්‍ය සිවුරින් හා කුස පරිහරණයට ප්‍රමාණවත් පිණ්ඩපාතයෙන් සෑහීමට පත්වීම, යම් තැනෙක චාරිකාවෙහි යෙදේ ද සිවුරු පිරිකර පමණක් රැගෙන පියාපත් බර පමණක් ඇති පක්ෂියෙකු මෙන් ක්‍රියා කිරීම." ඉහත සඳහන් පාඨයෙන් කියැවෙන බෞද්ධ පැවිදි ජීවිතයේ සුවිශේෂ ලක්ෂණය වන්නේ
(1) පිරිසිදු බඹසරයි.
(2) පරාර්ථ සේවයට කැපවීමයි.
(3) අල්පේච්ඡ ජීවිතයයි.
(4) ප්‍රාතිමෝක්ෂය ආරක්ෂා කිරීමයි.
(5) ගුරුවරයා අනුගමනය කිරීමයි.

13. භික්ෂු විනය අනුව සතර පාරාජිකා අතරට **නොගැනෙන** වරදක් වන්නේ,
(1) මනුෂ්‍ය ඝාතනයයි.
(2) මෛථුන සේවනයයි.
(3) අදත්තාදානයයි.
(4) මද්‍යසාර භාවිතයයි.
(5) තමා සතුව නැති උතුරු මිනිස් දම් ඇතැයි ප්‍රකාශ කිරීමයි.

14. මහ සඟරුවනේ නව වැදෑරුම් ගුණ අතර 'ආහුනෙය්‍ය' යන්නෙන් කියැවෙන්නේ,
(1) ගිහි ජනතාව කෙරෙහි කාරුණිකව කටයුතු කරන බව ය.
(2) දුරසිට ගෙනෙන ලද සිවුපසය පිළිගැනීමට සුදුසු බව ය.
(3) ඥාතීන් උදෙසා පිළියෙල කළ ප්‍රත්‍ය වුව ද පිරිනැමීමට සුදුසු බව ය.
(4) සසුන් මගට මනාකොට පිළිපන් බව ය.
(5) දක්ෂිණාව පිළිගැන්මට යෝග්‍ය බව ය.

[අනෙක් පිටුව බලන්න.

23. බුදුරජාණන් වහන්සේ විසින් ධර්ම කථික භික්ෂුණීන් අතර අග්‍රස්ථානයට පත් කළ භික්ෂුණිය වන්නේ,
(1) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියයි.
(2) ඛේමා තෙරණියයි.
(3) භද්දකච්චානා තෙරණියයි.
(4) ධම්මදින්නා තෙරණියයි.
(5) නන්දා තෙරණියයි.

24. දෙවන ධර්ම සංගීතියට තුඩුදුන් ශාසනික පසුබිම දැක්වීමේ දී ඇතැම් බෞද්ධ මූලාශ්‍රය දක්වන මහාදේව නම් හිමිනමක ඉදිරිපත් කළ පංච වස්තුවෙන් එකක් නම්,
(1) රන් රිදී ආදිය පිළිගැනීම කැපය යන්නයි.
(2) රහතුන් වහන්සේට සැක තිබිය හැකිය යන්නයි.
(3) ධර්මය නොදැන වුව ද රහත් විය හැකිය යන්නයි.
(4) රහතුන් වහන්සේලා විසින් ද පින් දහම් සිදුකළ යුතු ය යන්නයි.
(5) බුදුවරු තව්තිසාවෙහි වැඩසිටිති යන්නයි.

25. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක්කේ,
(1) භාණක සම්ප්‍රදාය ඇතිවීමයි.
(2) නිකාය භේදයට මුල පිරීමයි.
(3) කථාවත්ථුප්පකරණය සම්පාදනය කිරීමයි.
(4) කුඩා අනුකුඩා ශික්ෂාපද පිළිබඳ ප්‍රශ්නය යටපත් වීමයි.
(5) මහායාන බුදුදහම උදාවීමයි.

26. බුදු දහමෙහි ඉගැන්වෙන පඤ්චස්කන්ධයෙහි විඤ්ඤාණ ස්කන්ධය යන්නෙන් කියැවෙන්නේ,
(1) නිවැරදි අවබෝධයයි.
(2) සැපදුක් ආදී වින්දනයන් ය.
(3) ඉන්ද්‍රිය හා අරමුණු ආශ්‍රිත සවැදෑරුම් ඤාණයයි.
(4) බාහිර ලෝකය පිළිබඳව ඇති මතක ශක්තියයි.
(5) රූප ශබ්දාදිය පිළිබඳ උපදනා හැඟීම ය.

27. දුක පිළිබඳ ත්‍රිවිධ ප්‍රභේදයෙහි ඇතුළත් විපරිණාම දුක්ඛ යනු,
(1) සංස්කාර ධර්ම පිළිබඳ දුක ය.
(2) කැමති දේ නොලැබීමේ දුක ය.
(3) සිතෙහි උපදනා දොම්නස් ය.
(4) වෙනස්වීම පිළිබඳ දුක ය.
(5) රූපාදී අරමුණු හා බැඳුණු අසහනයයි.

28. සූත්‍රාන්ත ධර්මයන් අතර ත්‍රිලක්ෂණය සවිස්තරව පැහැදිලි කර ඇති දේශනාවක් වන්නේ,
(1) ධම්මික සූත්‍රයයි.
(2) මෙත්තානිසංස සූත්‍රයයි.
(3) පරාභව සූත්‍රයයි.
(4) පත්තකම්ම සූත්‍රයයි.
(5) චූළසච්චක සූත්‍රයයි.

29. භෞතික පරිසරය මනාව සංරක්ෂණය කිරීම සඳහා බෞද්ධයන් වන අප විසින් කළ යුතු සත් කාර්යයක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) වෙහෙර විහාරාදිය ඉදිකිරීමට ගංගාධාර යොදා ගැනීම ය.
(2) කිසිදු හේතුවක් නිසා ගසක් නොකැපීම ය.
(3) අසන්නාගේ පහසුව සලකා උස් හඬින් කතා කිරීම ය.
(4) කුණු රොඩු, මල මූත්‍රාදිය නිල්තණ මත නොදැමීම ය.
(5) කිසිවිටෙකත් පොළොව නොබිඳීම ය.

30. යහපත් අඹුසැමි සබඳතාවක් පවත්වාගෙන යාම පිණිස සැමියා විසින් බිරිඳට කළයුතු සංග්‍රහයක් වන්නේ,
(1) ගරු සැලකිලි කිරීමයි.
(2) බිරිඳගේ පිරිසට සංග්‍රහ කිරීමයි.
(3) සමානත්වයෙන් කටයුතු කිරීමයි.
(4) පුත්‍රදාරාදීන් රැකබලා ගැනීමට අනුග්‍රහ කිරීමයි.
(5) ආගමික කටයුතුවලට බිරිඳ පෙළඹවීමයි.

31. සැරියුත් මාහිමියන් වදාළ සච්චවිභංග සූත්‍රය අනුව සම්මා සංකප්ප යනු,
(1) දානමය, සීලමය හා භාවනාමය සංකල්පයන් ය.
(2) අලෝභ, අදෝස හා අමෝහ සංකල්පයන් ය.
(3) නෙක්ඛම්ම, අව්‍යාපාද හා අවිහිංසා සංකල්පයන් ය.
(4) සීල, සමාධි හා පඤ්ඤා සංකල්පයන් ය.
(5) අනිච්ච, දුක්ඛ හා අනත්ත සංකල්පයන් ය.

32. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවන හැඳින්වීමට යොදාගත හැක්කේ,
(1) තණ්හාව සම්පූර්ණයෙන් නැති කිරීම, යන්නයි.
(2) පින් දහම් කිරීමෙන් ලැබෙන උසස් ම ප්‍රතිඵලය, යන්නයි.
(3) සීල සමාදානයෙහි ආනිසංසය වේ, යන්නයි.
(4) පෙරුම් පිරීමෙන් ලබාගත හැකි විමුක්තිය, යන්නයි.
(5) පරලොව වශයෙන් ලබාගත හැකි උතුම් සැපත, යන්නයි.

33. බුද්ධ කාලීන ආගමික ප්‍රතිපදා අතර අත්තකිලමථානුයෝගය අනුගමනය කරන ලද්දේ,
(1) වෛදික බ්‍රාහ්මණ සමාජය විසිනි. (2) ජෛන නිගණ්ඨයන් විසිනි.
(3) අමරාවික්ඛේපවාදීන් විසිනි. (4) චාර්වාක චින්තකයන් විසිනි.
(5) උච්ඡේදවාදීන් විසිනි.

34. බුද්ධකාලීන භාරතීය මහණ බමුණන් අතර පැවති ශාස්වත දෘෂ්ටිය බුදුසමය විසින් පසෙකින් තබන ලද්දේ,
(1) එම දෘෂ්ටිවාදීන් පරලොවක් නොපිළිගත් නිසා ය.
(2) ඔවුන් කාමසුඛල්ලිකානුයෝගයට නැඹුරුව සිටි නිසා ය.
(3) එම දෘෂ්ටිය අනුව ආත්මයේ පැවැත්ම සපුරා බැහැර කළ නිසා ය.
(4) එම දෘෂ්ටි ගතිකයන් විසින් කර්ම විපාක ප්‍රතික්ෂේප කළ නිසා ය.
(5) එය දුකින් මිදීමට උපකාරී නොවන නිසා ය.

35. බුදුදහම අනුව සංස්ථාගත දුක හටගන්නේ සමාජය තුළ ආර්ථික, දේශපාලන, සදාචාරමය ආදී විවිධ ගැටලු මුහුකුරා යාමෙනි. චක්කවත්තිසීහනාද සූත්‍රයෙන් හඳුනාගත හැකි එබඳු ගැටලුවක් වන්නේ,
(1) නූගත්කමයි. (2) ජනගහන වර්ධනයයි.
(3) අකාර්යක්ෂම රාජ්‍ය පාලනයයි. (4) රෝග පීඩාදිය පැතිරයාමයි.
(5) කුලභේදයයි.

36. හොඳ-නරක පුද්ගල චර්යාවන් දැක්වීමට බුද්ධ දේශනාවල භාවිත වන ව්‍යවහාරයක් වන්නේ,
(1) ලෝක-ලෝකුත්තර යන්නයි. (2) සංඛත-අසංඛත යන්නයි.
(3) කාල-අකාල යන්නයි. (4) සාධු-අසාධු යන්නයි.
(5) සුගති-දුගති යන්නයි.

37. පුද්ගලයා විසින් නැවත නැවතත් කළ යුතු කුසල කර්ම සහ පුණ්‍ය කර්ම බුදුදහමෙහි දැක්වෙයි. ඒ අතුරෙන් කුසල කර්මයක් වන්නේ,
(1) පින් අනුමෝදන් වීමයි. (2) වතාවත් කිරීමයි.
(3) වැඩිහිටියන්ට සැලකීමයි. (4) දන්දීමයි.
(5) දැඩි ලෝභයෙන් තොරවීමයි.

38. ගෘහස්ථ ජීවිත ගතකරන බෞද්ධයන්ට අදාළ පන්සිල්වලට වඩා අටසිල් උසස් යැයි සැලකෙන්නේ එමගින්,
(1) ප්‍රාණඝාතාදි පවින් වැළකීම සිදුවන බැවිනි. (2) සමාජ හිතකාමියෙකු බිහිවන බැවිනි.
(3) නිසැකවම නිවනට ලඟාවිය හැකි බැවිනි. (4) අපිස් පැවැත්ම පුහුණු කරවන බැවිනි.
(5) ධ්‍යාන අභිඥාදිය ලබාගත හැකි බැවිනි.

39. ශ්‍රද්ධාව පිළිබඳ විවිධ බෞද්ධ හැඳින්වීම් අතුරෙන් එකක් වන්නේ,
(1) දෙව්ලොවට ඉනිමගකි යන්නයි. (2) බ්‍රහ්ම විහරණයකි යන්නයි.
(3) රෝපණය කළ යුතු බීජයකි යන්නයි. (4) බෞද්ධයෙකුට ප්‍රදීපයකි යන්නයි.
(5) පින්කිරියවතකි යන්නයි.

40. කර්මය පිළිබඳ බුද්ධ කාලීනව පිළිගත් විවිධ මතවාද අතර බුදුසමයට එකඟ **නොවන** මතවාදයක් වන්නේ,
(1) කර්මය කරන හා විඳින පුද්ගලයෙකු නැත යන්නයි.
(2) මනෝ කර්මයට වඩා කාය කර්මය බලවත් වේ යන්නයි.
(3) රහත්බවට පත් වූ විට පූර්ව කර්ම අහෝසි වේ යන්නයි.
(4) කර්මක්ෂය කිරීමෙන් විමුක්තිය ලැබේ යන්නයි.
(5) අල්පමාත්‍ර වූ පුණ්‍යකර්මයකින් හෝ රහතුන්ට ප්‍රයෝජනයක් නැත යන්නයි.

41. ගිහියෙකු විසින් උපයාගත් ධනය පරිහරණය කිරීමට අදාළව පත්තකම්ම සූත්‍රයෙහි සඳහන් උපදේශයක් වන්නේ,
(1) පඤ්චබලී ඉටු කිරීමයි.
(2) ඉපැයූ ධනයෙහි ගිජුබවින් තොරවීමයි.
(3) ධනය සිවුකොටසකට බෙදා පරිහරණය කිරීමයි.
(4) ධනය උවදුරුවලින් රැකගැනීමයි.
(5) අධිපරිභෝජනයෙන් තොරවීමයි.

**42.** රජය අනුමත නොකළ හොර තරාදියෙන් කිරා වෙළඳාම් කිරීම වරදක් බව දැක්වෙන බුද්ධ දේශනාව ඇතුළත් වන්නේ,
(1) සිගාලෝවාද සූත්‍රයේ ය.
(2) වාසෙට්ඨ සූත්‍රයේ ය.
(3) ධම්මික සූත්‍රයේ ය.
(4) රාසිය සූත්‍රයේ ය.
(5) බ්‍රහ්මජාල සූත්‍රයේ ය.

**43.** දසරාජ ධර්මයෙහි තපස යන්නෙන් අදහස් කරන්නේ,
(1) රජු මහලු වියේ දී තවුසෙකු විය යුතු බවයි.
(2) සිය රාජ්‍යයේ තවුසන්ට අනුග්‍රහ දැක්විය යුතු බවයි.
(3) ප්‍රතිපත්තිගරුක වියයුතු බවයි.
(4) ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත විය යුතු බවයි.
(5) ඡන්දයෙන් අගතියට නොයායුතු බවයි.

**44.** චක්කවත්තිසීහනාද සූත්‍රයට අනුව සක්විති රජු විසින් වූ ගුණාංග පහකින් යුක්තවිය යුතු ය. ඉන් එකක් වන්නේ,
(1) සිල්වතෙකු වීමයි.
(2) නිර්ධනයන්ට සේවය කිරීමයි.
(3) මහණ බමුණන්ගේ උපදෙස් පැතීමයි.
(4) ගොවියන්ට පහසුකම් සැළසීමයි.
(5) කාලානුරූපව කටයුතු කිරීමයි.

**45.** "ධම්මෙන පරෙ රඤ්ජේතීති ඛො වාසෙට්ඨා, රාජා" යන අග්ගඤ්ඤ සූත්‍රාගත ප්‍රකාශයෙහි අර්ථය නම්,
(1) රජු දැහැමින් රාජ්‍ය පාලනය කළ යුතු බවයි.
(2) සිල්වත් විය යුතු බවයි.
(3) අගතිගාමී නොවිය යුතු බවයි.
(4) ආගමික ස්ථානවලට පූජා පැවැත්විය යුතු බවයි.
(5) ජනතාවට හිංසා නොකළ යුතු බවයි.

**46.** සමථ හා විපස්සනා යැයි දෙයාකාර වන බෞද්ධ භාවනාවෙහි විපස්සනා යනු,
(1) පඤ්චනීවරණ යටපත් කිරීමයි.
(2) ලෞකික අභිඥා ලැබිය හැකි භාවනාවයි.
(3) ත්‍රිලක්ෂණය වැඩීමයි.
(4) බුද්ධ කාලීන මහණ බමුණන් වැඩූ භාවනාවකි.
(5) චිත්ත ඒකාග්‍රතාව උපදවා ගැනීමයි.

**47.** සතර සතිපට්ඨාන ධර්ම අතර චිත්තානුපස්සනාවට ඇතුළත් කරුණක් වන්නේ,
(1) අනුන්ගේ සිත් හසර දැනගැනීම ය.
(2) පඤ්චනීවරණ තමා තුළ ඇති නැති බව දැන ගැනීම ය.
(3) සියල්ල චිත්ත නියාමයට යටත් බව මෙනෙහි කිරීම ය.
(4) රාග සහිත සිත රාග සහිත යැයි දැනගැනීම ය.
(5) සුඛ දුක්ඛාදී වින්දන තේරුම් ගැනීම ය.

**48.** සමථ භාවනාවට එළඹෙන යෝගාවචරයාට අදාළ කර්මස්ථාන හතළිහක් විසුද්ධි මාර්ගයෙහි දැක්වේ. ඉන් එකක් නම්,
(1) දේවතානුස්සතියයි.
(2) දානානුස්සතියයි.
(3) කම්මානුස්සතියයි.
(4) චිත්තානුස්සතියයි.
(5) වේදනානුස්සතියයි.

**49.** භාවනා කිරීමට කමටහන් ලබාදෙන ගුරුවරයා සතුව පැවතිය යුතු ගුණාංගයක් වන්නේ,
(1) වැඩිහිටියෙකු වීම ය.
(2) මනා නුවණැත්තෙකු වීම ය.
(3) සැදැහැවතෙකු වීම ය.
(4) පරිත්‍යාගශීලියෙකු වීම ය.
(5) වරදට අවවාද කරන සුළු අයෙකු වීම ය.

**50.** මෛත්‍රී භාවනාව වඩන්නෙකුට පරලොව වශයෙන් ලැබෙන ආනිසංසය වන්නේ,
(1) නොමුලාව කලුරිය කිරීමයි.
(2) මරණින් මතු බඹලොව උපත ලැබීමයි.
(3) ධනධාන්‍යාදී සැප සම්පත් ලැබීමයි.
(4) උසස් ප්‍රඥාවන්තයෙකු වීමයි.
(5) රූපීන් අගතැන්පත් වීමයි.

* * *